සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

තෙවන වාර පරීක්ෂණය 2017 — 11 ශ්‍රේණිය

மூன்றாம் தவணைப் பரீட்சை 2017 — தரம் 11

**Third Team Test 2017** — **Grade 11**

බුද්ධ ධර්මය I — පැය එකයි

**Buddhist I** — **One hours**

නම/විභාග අංකය : ....................................................................

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන තෙක් පිළිතුරු තෝරන්න.**

1. බෝසත් උපත ලොව සිදු වූ අසිරිමත් සිදුවීමකි. ඒ සඳහා දේවාරාධනාව ලැබූ පසු බෝසත්වරයෙකු විසින් පූර්ව අධ්‍යයනයක් කරනු ලබන්නේ,
   1. පංච මහා විලෝකන පිළිබඳව
   2. චතුරාර්ය සත්‍ය පිළිබඳව
   3. සිංහනාද පැවැත්වීම පිළිබඳව
   4. සතර පෙර නිමිති පිළිබඳව

2. තෙරුවන් ගුණ දැන ඇතිකර ගන්නා පැහැදීම
   1. ශ්‍රද්ධාව
   2. පැහැදිම
   3. බුදුගුණ සිහිකිරීම
   4. ධර්මය සිහි කිරීමයි

3. බුදුරදුන්ගේ ගුණ සිහි කරමින් කරන භාවනා හඳුන්වන්නේ,
   1. මෛත්‍රී භාවනාවයි
   2. බුද්ධානුස්සති භාවනාවයි
   3. ආනාපානාසති භාවනාවයි
   4. ත්‍රිලක්ෂණ භාවනාවයි

4. මහීච්ජතාව යනු,
   1. අසීමිත ආශාවන්ගෙන් යුක්ත වීම
   2. ලද පමණක් සතුටු වීම බවයි
   3. පහසුවෙන් පෝෂණය කළ හැකි බවයි
   4. බොහෝ වැඩ කටයුතුවලින් තොර බවයි

5. බුදුන් වහන්සේ දේශනා කර ඇති පරිදි සිල්වත් වීමේ ආනිශංස ගණන,
   1. 4 කි
   2. 5 කි
   3. 6 කි
   4. 8 කි

6. වැරදි පුද්ගලයා බහුල සමාජයක වැරදි වලින් ඉවත්ව ඒවාට අනුබල නොදී වාසය කිරීම හැඳින්වෙන්නේ,
   1. හුදෙකලා ජීවිතයකි යන්නයි
   2. සංකර ජීවිතයකි යන්නයි
   3. පද්මාකාර ජීවිතයකි යන්නයි
   4. අධාර්මික ජීවිතයකි යන්නයි

7. සිව්බඹ විහරණවලට අයත් නොවන්නේ,

1. දානය
2. මෛත්‍රිය
3. කරුණාව
4. මුදිතාව

8. සප්ත අපරිහානීය ධර්ම යොදා ගනිමින් ධාර්මික පාලන තන්ත්‍රයක් ස්ථාපිත කළ බෞද්ධ රාජ්‍යයන් ලෙස ප්‍රකට වන්නේ,

1. ලිච්ඡවී රජ දරුවන් විසින්ය
2. මල්ල රජ දරුවන් විසින්ය
3. කෝසල රජ විසින්ය
4. බිම්බිසාර රජ විසින්ය

9. ධම්මපදය අයත් වන්නේ සූත්‍ර පිටකයේ

1. දීඝ නිකායටය
2. මජ්ඣිම නිකායටය
3. අංගුත්තර නිකායටය
4. ඛුද්දක නිකායටය

10. ඇස, කන, නාසය ආදී ඉන්ද්‍රියන්ට අරමුණු වන්නේ,

1. රූප, ශබ්ද, ගන්ධ ආදියයි
2. චක්ඛු, සෝත, ඝාණ ආදියයි
3. කාම, භව, විභව, ආදියයි
4. ජාති, ජරා, මරණ ආදියයි

11. පරලොව දියුණුව පිළිබඳ විග්‍රහ කොට ඇති සූත්‍රය,

1. කරණීයමෙත්ත සූත්‍රය
2. රතන සූත්‍රය
3. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
4. මංගල සූත්‍රය

12. ලෝවැසියාට වැඩ පිණිස ඇති ලෝවැඩ සඟරාව රචනා කරන ලද්දේ,

1. වැත්තෑවේ හිමි
2. රාහුල හිමි
3. වීදාගම මෛත්‍රී මහා හිමිපාණන්
4. ආනන්ද මෛත්‍රී හිමියන්

13. දානාදී පිං කිරීමෙන් පුද්ගලයාට ලැබෙන යහපත් ප්‍රතිඵල නම්,

1. සැප, බල, මුදල්, ඉඩකඩම්
2. ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා
3. යාන, වාහන, ඉඩම්, මුදල්, සැප
4. සැප, මුදල්, යාන, වාහන, බල

14. "ඉමස්මිං සති ඉදං හෝති" මෙහි අරුත නම්,

1. අසවලා මට බැන්නේය
2. මෙය ඇති කල්හි මෙය ඇතිවේ
3. අඩු ආයුෂ සහිත මියයාම
4. පෙර පැවැත්ම දැකීමයි

15. පෙර කරන ලද කර්මවලට අනුව විපාක විඳීමට සිදුවන බව දැක්වෙන සූත්‍රය නම්,

1. සිඟාලෝවාද සූත්‍රය
2. චූල්ලකම්ම විභංග සූත්‍රය
3. රතන සූත්‍රය
4. කරණීයමෙත්ත සූත්‍රය

16. පුබ්බේ නිවාසානුස්සති ඥාණය නම්,

1. පෙර ජීවිතය දැකීමේ නුවණ
2. පෙර කරන ලද විපාක දැකීමේ නුවණ
3. පෙර පැවැත්ම දැකීමේ නුවණ
4. මේ සියල්ලම

17. යම් කරුණක් පිළිගැනීමට හෝ නොපිළිගැනීම පිළිබඳ සිතා විමසා කටයුතු කිරීමේ නිදහස අගයන සූත්‍රය

1. මහා මංගල සූත්‍රය
2. කාලාම සූත්‍රය
3. සිඟාලෝවාද සූත්‍රය
4. රතන සූත්‍රය

18. ප්‍රාග් බෞද්ධ යුගය යනු,

1. බුදු දහම හඳුන්වා දීමට පසු යුගය
2. බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු යුගය
3. බුදු දහම හඳුන්වා දීමට පෙර යුගය
4. පරිනිර්වාණයට පෙර යුගය

19. "විනයෝ නාම සාසනස්ස ආයු" යන්නෙන් ගම්‍ය වන්නේ,

1. විනය සසුනේ ආයුෂයි
2. දූක සසුනේ ආයුෂයි
3. ගරු බව සසුනේ ආයුෂයි
4. සැප සසුනේ ආයුෂයි

20. තෙවන ධර්ම සංගායනාව හැඳින් වූ නම වනුයේ,

1. සාහස්සිකා සංගීතිය
2. සංගායනා සංගීතිය
3. ධර්ම සංගීතිය
4. ධර්ම ප්‍රදීපිකාව

21. පූජ්‍ය රේරුකානේ චන්දවිමල නා හිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයකි,

1. සද්ධර්මරත්නාවලිය
2. පාරමිතා ප්‍රකරණය
3. ධර්මප්‍රදීපිකාව
4. සසඳාවත

22. මහින්දාගමනය සිදුවන්නේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර කීයක් ගත වීමෙන් පසුවද?

1. වර්ෂ 231 කි
2. වර්ෂ 100 කි
3. මාස 3 කි
4. වර්ෂ 236 කි

23. "රහසත් පව් නොකොට ..........." යන කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

1. ලෝකෝපකාරයයි
2. සුභාෂිතයයි
3. බුදුගුණාලංකාරයයි
4. කාව්‍යශේඛරයයි

24. විපස්සනා භාවනාව හඳුන්වන වෙනත් නම් ඇතුළත් වරණය වනුයේ,

1. ප්‍රඥා, තිලකුණු, සමාධි
2. චිත්ත, ප්‍රඥා, සමාධි
3. ප්‍රඥා, තිලකුණු, විදර්ශනා
4. චිත්ත, සමාධි, සමථ

25. සිදුහත් බෝසතාණන් වහන්සේ කිංකුසල ගවේසීව සිටි කාලයේ උන්වහන්සේට හමු වූ ආලාර කාලාම තවුසා,

1. සප්ත සමාපත්ති ලාභියෙකි
2. අෂ්ට සමාපත්ති ලාභියෙකි
3. පංච අභිඥා ලාභියෙකි
4. පංච අභිඥා අෂ්ට සමාපත්ති ලාභියෙකි

26. ලක්දිව බුදු දහම ස්ථාපිතවීමත් සමග ඉදි වූ පළමු ස්තූපය නිදන් කොට ඇත්තේ,

1. ග්‍රීවා ධාතුවයි
2. දකුණු අකු ධාතුවයි
3. දකුණු දළදාවයි
4. ලලාට ධාතුවයි

27. සියබස්ලකර කෘතිය රචනා වන්නේ,

1. අනුරාධපුර යුගයේදී
2. පොළොන්නරු යුගයේදී
3. දඹදෙණි යුගයේදී
4. කුරුණෑගල යුගයේදී

28. ස්තූපයන්හි සිව්දිශාවට මුහුණතා තනන ලද අලංකාර තොරණ

1. වටදාගෙය
2. වාහල්කඩ
3. බෝධිඝරය
4. පිටගැටපෙළ

29. වෙනස්වීමේ ස්වභාවය හේතුවෙන් ඇතිවන දුක් සහිත බව බුදු දහමේ හැඳින්වෙන්නේ,

1. අනාත්ම ලක්‍ෂණය ලෙසය
2. අනිත්‍ය ලක්‍ෂණය ලෙසය
3. දුක්ඛ පටික්කුලා ලක්‍ෂණය ලෙසය
4. දුක්ඛ ලක්‍ෂණය ලෙසය

30. බුද දහමේ සීල, සමාධි, ප්‍රඥා, යනුවෙන් හඳුන්වන්නේ,

1. ත්‍රිවිධ බෝධියයි
2. ත්‍රිවිධ ශික්ෂාවයි
3. ත්‍රිවිධ චෛත්‍යයි
4. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා

31. සෙම් ධාතුව කිපීමෙන් ශරීරියට රෝග වැළඳේ, එවැනි කරුණු 8 ක් ඇතුළත් කරමින් දේශාන කළ සූත්‍රයක් වන්නේ,

1. රතන සූත්‍රය
2. ගිරිමානන්ද සූත්‍රය
3. චංකමන සූත්‍රය
4. දම්සක් පැවතුම් සූත්‍රය

32. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍ය යනු භික්ෂු වහන්සේලා ලබන,

1. සිව්සස් ය
2. සිව්පසයයි
3. සිව්බඹ විහරණයයි
4. සිව් පිරිසයි

33. අවිධිමත් මෙන්ම ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ. නැගිට ගැනීමටවත් නොහැකි තරමට ආහාර අනුභව කරන්නා හඳුන්වන්නේ,

1. කාක මාසක
2. භුක්තවමිතක
3. අලංසාටක
4. තත්ථාවට්ටක

34. කනිෂ්ක රජ දවස කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පවත්වන ලද්දේ,

1. සිව්වන සංගායනාවයි
2. ප්‍රථම සංගායනාවයි
3. තෙවන සංගායනාවයි
4. දෙවන සංගායනාවයි

35. ගන්ධ කුටි, ප්‍රාසාද, ගෙඩිගේ යන කලා නිර්මාණයන්ට අනුව නිර්මාණය කරනු ලබන්නේ,

1. චෛතිය ගෘහයයි
2. ධාතු මන්දිරයයි
3. ප්‍රතිමා ගෘහයයි
4. බෝධිඝරයයි

36. ආර්ය මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරන නිසා,

1. උජුපටිපන්න වේ
2. සුපටිපන්න වේ
3. ආහුණෙය්‍යය වේ
4. ඤායපටිපන්න වේ

37. බෞද්ධයකු වීමේ පළමු පියවර වන්නේ,

1. පන්සිල් සමාදන් වීම
2. පැවිදි වීම
3. අටසිල් සමාදන් වීම
4. තෙරුවන් සරණ යාම

38. තම සිතෙහි විවිධ වස්තු කෙරෙහි ආශාව බහුලව පවතී නම් යහපත් සිතිවිලි හෝ තමාගේ වටිනාකම හෝ මතකයට නොනැගේ. මෙය

1. ථීනමිද්ධය වේ
2. ව්‍යාපාදය වේ
3. කාමච්ඡන්දය වේ
4. උද්ධච්ච කුක්කුච්ච වේ

39. මහාචාර්ය පරණවිතාන ශූරීන්ගේ අදහසට අනුව ලාංකික කැටයම් ශිල්පයාගේ විශ්මිත කලා කෞශල්‍යය ලොවට හෙළි කරන සුවිශේෂි නිර්මාණයකි,

1. මුරගල
2. කොරවක්ගල
3. සඳකඩ පහණ
4. බෝධිළරය

40. බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම් සභා මණ්ඩපයක් බවට පත් කරගත් අවස්ථාවකට නිදසුනකි.

1. පටාචාරාවට දම් දෙසුම
2. අනුරුද්ධ හිමියන්ට දම් දෙසුම
3. දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කිරීම
4. රාහුල හිමියන්ට දම් දෙසුම

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

තෙවන වාර පරීක්ෂණය 2017 — 11 ශ්‍රේණිය

மூன்றாம் தவணைப் பரீட்சை 2017 — தரம் 11

**Third Team Test 2017** — **Grade 11**

බුද්ධ ධර්මය **II**

**Buddhist II**

පැය දෙකයි

**Two hours**

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **පළමු වැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමි වේ.**

(01). i. සම්මා ආජීවයට අයත් දැහැමි ජීවනෝපායන් දෙකක් නම් කරන්න.

ii. බෝධීන් වහන්සේගේ ආරක්ෂාව පිණිස ඒ වටා ඉදි කරන ලද පටු පියස්සක් සහිත මණ්ඩලය හඳුන්වන නම කුමක්ද?

iii. "සමවායෝ ඒව සාධු" යන්නෙහි තේරුම් කුමක්ද?

iv. ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙහි ඇතුළත් මොලොව දියුණුවට හේතුවන කරුණු 4 කි. ඉන් දෙකක් ලියා දක්වන්න.

v. සිදුහත් බෝසතුන් සීල පාරමිතාව පිරූ ජාතක කතාව කුමක්ද?

vi. බුදුරදුන්ගේ මංගල ධර්ම දේශනාව දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවයි. එහි ඇතුළත් අත්හළ යුතු අන්ත දෙක කුමක්ද?

vii. පව් නොකරන අය සමාජයේ ගෞරවයට පාත්‍ර වේ. රහසින්වත් පව් නොරකනවා යනු අවංක වීමයි. බුදු සිරිතේ එම ගුණය හඳුන්වන්නේ කුමන නමකින්ද?

viii. චතුර්විධ වචී සුචරිතය නම් කරන්න.

ix. සමථ භාවනාව සඳහා යොමුවීමේදී තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

x. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකවත් රජ සැප පිණිස නොවන්නේය. මෙම සැදැහැති ප්‍රකාශ කළ රජතුමා කවුද?

(02). නිර්මල කුඩා අවධියේ සිටම විවිධ ගැටලුවලට මුහුණ දුන් ශිෂ්‍යයෙකි. දෙමාපිය සෙනෙහස අහිමි වීමත් දහක් ආර්ථික ගැටලුත් ඒ අතර ප්‍රධාන වේ. ඔහු සියලු විභාග විශිෂ්ට ලෙස ජය ගෙන විශ්ව විද්‍යාලය දක්වාම නොසැලී ගමන් කළේය.

i. නිර්මල මුහුණ දුන් අභියෝග දෙකක් නම් කරන්න (ලකුණු 02)

ii. බෝසත් සිරිතෙහි අභියෝග ජයගත් අවස්ථා තුනක් කෙටියෙන් පහදන්න. (ලකුණු 03)

iii. යෞවනයෙකුට බෝසත් චරිතය චරිතායනය කිරීමෙන් සාර්ථක ජීවිතයක් ගොඩනගා ගත හැකි අයුරු නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 05)

(03). i. “තංච කම්මං කථං සාධු - යං කත්වා නානු තප්පති” යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ අර්ථය ලියන්න. (ලකුණු 03)

iii. බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන ධම්ම පදය ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05)

(04). i. සිගාලෝවාද සූත්‍රය දේශනා කරන ලද්දේ කාහටද? (ලකුණු 02)

ii. සිගාලෝවාද සූත්‍රයේ එන සමාජ කොටස් කීයද? එයින් 2 ක් නම් කරන්න. (ලකුණු 03)

iii. “නූතන සමාජයේ ප්‍රශ්න විසඳාලීම සඳහා සදිසා නමස්කාරය බොහෙවින් ඉවහල් වේ” පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05). රටක දියුණුවට එම රටෙහි පවත්නා දේශපාලන ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් සාධකයකි. රාජ්‍ය පාලනය අධාර්මික වන විට රටෙහි සෑම අංශයකම පරිහානිය සිදුවේ. මෙය මැනවින් අවබෝධ කරගත් බුදුරජාණන් වහන්සේ දැහැමි රාජ්‍ය පාලනයක් ඇතිකර ගැනීම උදෙසා අවශ්‍ය දහම් කරුණු රාශියක් දේශනා කළ සේක.

i. දැහැමි රාජ්‍ය පාලනයක් ඇතිකර ගැනීම සඳහා අනුගමනය කළයුතු ප්‍රතිපත්ති අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. එම ප්‍රතිපත්ති අතරින් එක් ප්‍රතිපත්තියක් පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් ලියන්න. (ලකුණු 03)

iii. වර්තමානයේ දැහැමි රාජ්‍ය පාලනයක් පවත්වා ගෙන යාමට බුද්ධ දේශනා ඉවහල් කරගත යුතු ආකාරය පෙන්වා දෙන්න (ලකුණු 05)

(06). i. කර්මය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. පුද්ගලයා විසින් කයින් කරනු ලබන අකුසල කර්ම මොනවාද? (ලකුණු 03)

iii. ඔබගේ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා කර්මය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07). පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළබඳව කෙටි සටහන් ලියන්න.

i. පරිසරය (ලකුණු 05)

ii. ධර්ම සංගායනා (ලකුණු 05)

iii. වැලිවිට සරණංකර සංඝරාජ නා හිමි (ලකුණු 05)

iv. භාවනාව (ලකුණු 05)